# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**07 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය 07 - ශක්ති ආහාර හා සංචිත**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ශක්තිය මැනීමේ ජාත්‍යන්තර සම්මත ඒකකය මින් කුමක්ද?
1) කිලෝග්‍රෑම් 2) නිව්ටන් 3) ජූල් 4) කැලරි

02) ශක්ති ආකාරයක් නොවන්නේ,
1) තාපය 2) වාතය 3) ධ්වනිය 4) විදුලිය

03) චාලක ශක්තිය අඩංගු වන්නේ පහත සඳහන් කවරක ද?
1) ගසක ඇති ගෙඩියක 2) සරුංගලයක
3) ගලායන ජලයේ 4) ඇදී ඇති රබර් පටියක

04) පහත අවස්ථා අතුරින් කාර්යයක් සිදුවන අවස්ථාව වන්නේ,
1) විදුලි පංකාවක් කැරකීම. 2) කුඩා ළමයෙක් බිත්තියක් තල්ලු කිරීම.
3) ළමයෙක් විශාල ගසක් තල්ලු කිරීම. 4) කුඩා දරුවෙක් සිමෙන්ති කොට්ටයක් එසවීම.

05) සූර්ය කෝෂයකින් විදුලිය නිපදවා ගැනීමේදී ශක්ති පරිණාමනය පහත සඳහන් කවරක්ද?
1) රසායනික ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය
2) ආලෝක ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය
3) තාපජ ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය
4) චාලක ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය

06) තාපය නිසා සිදුවන විපර්යාසයකි,
1) උෂ්ණත්වය ඉහළ යාම 2) වාෂ්ප වීම
3) වර්ණය වෙනස් වීම 4) ඉහත සඳහන් සියල්ල

07) පහත සඳහන් ශක්ති පරිණාමනය සිදුවන්නේ කවර උපකරණය ක්‍රියාකරන විටද?
විද්‍යුත් ශක්තිය ⟶ චාලක ශක්තිය

1) ඩයිනමෝව 2) මෝටරය 3) බල්බය 4) විදුලි උඳුන

08) වියළි කෝෂයක සිදුවන ශක්ති පරිණාමනය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
1) විද්‍යුත් ශක්තිය ⟶ රසායනික ශක්තිය
2) චාලක ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය
3) තාපජ ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය
4) රසායනික ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය

09) යාන්ත්‍රික ශක්තිය ලෙස හැඳින්වෙන් ශක්ති ආහාර දෙක වන්නේ,
1) විභව ශක්තිය හා ධ්වනි ශක්තිය 2) විභව ශක්තිය හා චාලක ශක්තිය
3) ධ්වනි ශක්තිය හා ආලෝක ශක්තිය 4) ආලෝක ශක්තිය හා තාපජ ශක්තිය

10) ශාක තුළ ආහාර නිෂ්පාදනයේ දී සිදුවන ශක්ති පරිණාමනය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

1) ආලෝක ශක්තිය ⟶ විභව ශක්තිය
2) සූර්ය ශක්තිය ⟶ රසායනික ශක්තිය
3) ආලෝක ශක්තිය ⟶ රසායනික ශක්තිය
4) සූර්ය ශක්තිය ⟶ විභව ශක්තිය

**01) වරහන තුළ දී ඇති ඒවායින් සුදුසු පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(චාලක ශක්තිය, දහනය, කාර්යය, වියළිකෝෂය, විභව ශක්තිය, ජූල්, යාන්ත්‍රික ශක්තිය, පරිවර්තනය, ආලෝක ශක්තිය, තාපජ ශක්තිය)**

1) ශක්තිය යනු .............................. කිරීමේ හැකියාවයි.
2) ශක්තිය මනින අන්තර් ජාතික සම්මත ඒකකය .............................. වේ.
3) කාර්ය කිරීමේදී ශක්ති .............................. සිදුවේ.
4) දර වියළීම සඳහා .............................. අවශ්‍ය වේ.
5) විභව ශක්තිය හා චාලක ශක්තිය පොදුවේ .............................. ලෙස හැඳින්වේ.
6) වස්තුවක් පිහිටීමේ හෝ හැඩයේ වෙනස් වීම නිසා වස්තුවක් තුළ ගබඩා වන ශක්තිය .............................. ලෙස හඳුන්වයි.
7) චලනය වන වස්තුවක ගබඩා වී ඇති ශක්තිය .............................. ලෙස හැඳින්වේ.
8) ප්‍රභාසංස්ලේෂණයේදී .............................. රසායනික ශක්තිය බවට පත්වේ.
9) .............................. මඟින් රසායනික ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත්වේ.
10) ඉන්ධන .............................. කිරීම නිසා රසායනික ශක්තිය තාපජ ශක්තිය බවට පත්වේ.

02) **පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1) විභව ශක්තිය යනු කුමක්ද?
2) විභව ශක්තිය අඩංගු ද්‍රව්‍ය 3 ක නම් ලියන්න.
3) චාලක ශක්තිය යනු කුමක්ද?
4) චාලක ශක්තිය අඩංගු වස්තු 3 ක නම් කරන්න.
5) ගලායන ජලයේ ශක්තියෙන් කාර්ය සිදුකරන අවස්ථා 3 ක් සඳහන් කරන්න.
6) ශක්ති පරිණාමනය යනු කුමක්ද?
7) පහත සඳහන් අවස්ථාවල සිදුවන ශක්ති පරිණාමනය ලියන්න.

a) විදුලි මෝටරයක් කරකැවීම
b) විදුලි බල්බයක් දැල්වීම
c) පාපැදියේ ලාම්පුව දැල්වීම
d) වියළි කෝෂයකින් විදුලිය ලබා ගැනීම
e) බිම ඇති පෙට්ටියක් ඔසවා මේසය මත තැබීම
f) වහලේ ඇති උලුකැටයක් බිමට වැටීම

*සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය*